පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- ගණිතය

සතිය- 39

ශ්‍රේණිය-10

සැකැස්ම -G.U.D.කුමාර කෑ/දෙහි/ ගෝනගල ම. වි.

# 28 පාඩම - නිර්මාණ

## මූලික පථ

**යම් අවශ්‍යතා එකක් හෝ කිහිපයක් සපුරාලන පරිදි ඇති ලක්ෂ්‍ය කුලකයට පථයක් යැයි කියනු ලැබේ.**

**මූලික පථ හතරක් ඇත**

1. අචල ලක්ෂයකට නියත දුරින් පිහිටි ලක්ෂයක පථය වෘත්තයකි








**2.**අචල ලක්ෂ්‍ය දෙකකට සම දුරිකින් චලනය වන ලක්ෂ්‍යයක පථය එම අචල ලක්ෂ්‍ය දෙක යා කරන රේඛා ඛණ්ඩයේ ලම්බ සමච්ඡේදකය වේ.







3.දී ඇති සරල රේඛාවකට සමදුරින් පිහිටි ලක්ෂ්‍යයක පථය එම රේඛාවට සමාන්තර සම දුරින් පිහිටි සරල රේඛා දෙකකි.





4. *ඡේදනය වන සරල රේඛා දෙකකට සම දුරින් වූ ලක්ෂ්‍යයක පථය එම සරල රේඛා දෙක ඡේදනය වීමෙන් සෑදෙන කෝණයේ, සමච්ඡේදකය වේ.*




